## 11 ශ්‍රේණිය කෘෂි හා ආහාර තාක්ෂණය

MCQ පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1) 1 | (2) 3 | (3) 2 | (4) 2 | (5) 4 | (6) 1 | (7) 1 | (8) 1 | (9) 4 | (10) 2 |
| (11) 3 | (12) 1 | (13) 4 | (14) 2 | (15) 3 | (16) 1 | (17) 2 | (18) 4 | (19) 3 | (20) 1 |
| (21) 4 | (22) 3 | (23) 3 | (24) 2 | (25) 2 | (26) 3 | (27) 1 | (28) 2 | (29) 2 | (30) 1 |
| (31) 4 | (32) 1 | (33) 3 | (34) 1 | (35) 3 | (36) 1 | (37) 1 | (38) 2 | (39) 2 | (40) 1 |

## II කොටස - පිළිතුරු

1. i) a) උස් පාත්ති, ගිල් වූ පාත්ති, වැටි හා කාණු, තනි වගා වලවල් (ලකුණු 01)
   b) වැටි හා කාණු (ලකුණු 01)

   ii) මතුපිට පස් හා කාබනික පොහොර (ලකුණු 01)
   1:1 අනුපාතයට (ලකුණු 01)

   iii) කෙසෙල් පඬරුල්, අස්වැන්න නෙලාගත් පසු ඉතුරු වන රටකජු බෝග, අමු කොළ පත්‍ර යනාදිය (ලකුණු 02)
   1:1 අනුපාතයට (ලකුණු 01)

   iv) නයිට්‍රජන් (N) ඌනතා ලක්ෂණ (ලකුණු 02)

   v) දුම්කොළ නැටි සාරය, අරලිය මල් සාරය, කොච්චි සාරය, සුදු ළූණු සාරය (ලකුණු 02)

   vi) විසිරි හා බිංදු ජල සම්පාදන ක්‍රම (ලකුණු 02)

   vii) පහේ බෙදීමේ ක්‍රමය, සමචතුරස්‍ර ක්‍රමය (ලකුණු 02)

   viii) ඉල් මැස්සා (ලකුණු 02)

   ix) උදැල්ල, වීඩරය, තුන් පුරුක් කල්ටි මීටරය, රේක්ක, රිජරය, රොටඩේටරය, කොකු නගුල (පෝරු වර්ග) යනාදිය (ලකුණු 02)

   x) නියමිත වර්ණය/ සුවඳ/ රසය නොමැති වීම (ලකුණු 02)

2. i) පසේ භෞතික තත්ත්වයන් දියුණු කිරීම, ඒ ඒ බෝගයට ගැළපෙන පරිදි භූමිය සකස් කිරීම, පසේ ඇති ගල් මුල් ආදිය පසෙන් ඉවත් කිරීම, පසට පොහොර මිශ්‍ර කිරීම, පළිබෝධ පාලනය වැනි පිළිතුරු සඳහා

(ලකුණු 01 x 02 = 02)

ii) a) උස් වූ පාත්ති/ ගිල්ලූ පාත්ති/ වැටි හා කානු/ තනි වගා වලවල් (ලකුණු 01 x 02 = 02)

b) උදැල්ල/අත් මුල්ලුව/ උදළු මුල්ලු/ අත් ඉස්කෝප්පය/තුන් පුරුක් කල්ටි වේටරය/ උදැල්ල කෝණෝව්ඩරය/ රේක්ක ආදිය (ලකුණු 01 x 02 = 02)

iii)




(රූප සටහන ඇඳ නම් කිරීම :- ලකුණු 02
විස්තර කිරීම :- ලකුණු 02)

3. i) පසේ අඩංගු පෝෂක ප්‍රමාණය, දේශගුණික තත්ත්වය, පසේ තෙතමන ස්වභාවය, වගා කර ඇති බෝගයට සුදුසු පොහොර යෙදීමේ ක්‍රම අනුගමනය කිරීම, ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණ මූලධර්ම අනුගමනය කිරීම, වගාවේ අවස්ථාවට සුදුසු පොහොර වර්ගය තෝරා ගැනීම ආදිය... (ලකුණු 01 x 02 = 02)

ii) a) පසේ සාරවත් බව පවත්වා ගනිමින් අවශ්‍යතාව පරිදි අකාබනික හා කාබනික ශාක පෝෂක ප්‍රභවයන් භාවිත කිරීම (ලකුණු 02)

b) මියුරියේට් ඔෆ් පොටෑෂ්
සල්ෆේට් ඔෆ් පොටෑෂ් (ලකුණු 01 x 02 = 02)

iii)

- ක්ෂේත්‍රයට දිගින් දිගටම යෙදීමෙන් පසේ PH අගය බෝග වගාවට අහිතකර පරිදි වෙනස් විය හැක.
- නිර්දේශිත ප්‍රමාණවලට වඩා වැඩියෙන් යෙදුවහොත් ශාක මිය යා හැක.
- මිල අධික ය.
- සමහර පොහොර ගබඩා කර තැබීමේ දි දියවී යයි.
- නියමිත පොහොර යෙදීමේ ක්‍රම අනුගමනය නොකළහොත් වාෂ්පීකරණය හා වරනය වීමෙන් පෝෂක හානි වීමට ඉඩ ඇත.
- වැඩිපුර කසළ යෙදීමෙන් භූගත ජලය ඇතුලු ජල ප්‍රභව දූෂණය වේ. ආදිය විස්තර කිරීම...

(ලකුණු 04)

4. i)

- අහිතකර තත්ත්වය යටතේ වුවද හොඳින් වර්ධනය වේ.
- සීඝ්‍රයෙන් පැතිරේ.
- අහිතකර කාල වලදී නොනැසි පැවතිමේ හැකියාව ඇත.
- පලිබෝධ හානි වලට ඔරොත්තු දේ.
- ශක්තිමත් මූල පද්ධතියක් සහිතය.
- ජීවන චක්‍රය කෙටිය.
- විවිධ ක්‍රම මගින් ව්‍යාප්ත වේ. ආදිය... (ලකුණු 01 x 02 = 02)

ii) a)

- තෘණ , පන් , පළල් පත්‍ර (ලකුණු 01 x 02 = 02)

b) ගඳපාන, පාතිනියම්, වීඩේලියා ,පිලිපීන්, ෆයර්වර්ක් (ලකුණු 01 x 02 = 02)

iii)

| වාසි | අවාසි |
|---|---|
| සත්ව ආහාර ලෙස භාවිත කළ හැක | ජල මාර්ග අවහිර වේ |
| ඖෂධ ලෙස භාවිතයට ගත හැක | සමහර වල් පැළෑටි මිනිසාට හා සතුන්ට හානි කරයි |

යනාදි ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න (ලකුණු 01 x 04 =04)

5. i) අධෝභෞම ප්‍රරෝහණය
අපිභෞම ප්‍රරෝහණය (ලකුණු 01 x 02 = 02)

ii) a)

- ආවේනික පාරිශුද්ධතාවක් තිබීම
- භෞතික පාරිශුද්ධතාව තිබීම
- බොල් බීජවලින් තොරවීම
- වල් පැළෑටි බීජ වලින් තොර වීම
- ඉහළ ප්‍රරෝහණ ප්‍රතිශතයක් තිබීම (ලකුණු 01 x 02 = 02)

b)

- තෙතමන ප්‍රතිශතය 13% ට වඩා අඩු විය යුතුයි
- ප්‍රරෝහණ ප්‍රතිශතය 85% ට වඩා වැඩි විය යුතුයි
- 500g ක තිබිය හැකි යාන්ත්‍රික හානි වූ උපරිම වී බීජ ගණන 200 කි
- වී 500g ක තිබිය හැකි උපරිම වල් බීජ ගණන 200 කි
- භෞතික පාරිශුද්ධතාව 98% හෝ ඊට වඩා වැඩි විය යුතුයි
- ප්‍රවේණික පාරිශුද්ධතාව 90% හෝ ඊට වඩා වැඩි විය යුතුයි (ලකුණු 01 x 02 = 02)

iii) පෙට්‍රිදිසි ක්‍රමය මගින් ප්‍රරෝහණ ප්‍රතිශතය විස්තර කිරීමට (ලකුණු 03)

6. i) ඒක බෝග වගාව
බහු බෝග වගාව (ලකුණු 01 x 02 = 02)

ii) a) යම් ස්ථානයක පස, ජලය, පෝෂක හා ජෛව විවිධත්වය ආරක්ෂා කරගත හැකි පරිදි භූමිය හා ජලය මනා ලෙස උපයෝගී කර ගනිමින් බෝග වගා කටයුතු සිදු කරන ගොවිතැන් පද්ධතියක් සංරක්ෂණ ගොවිතැන ලෙස හඳුන්වයි. (ලකුණු 02)

b)

- නිෂ්පාදන ඒකක කිහිපයක් ඇති නිසා නිවැසියන්ට සමබල ආහාරයක් ලබා ගත හැකි වීම
- ශ්‍රමය වසර පුරා යොදා ගත හැකි වීම
- පොහොර හා සත්ත්ව නිෂ්පාදන සඳහා යන වියදම අවම වීම
- වසර පුරා ආදායම් ලැබීම
- ගොවියාගේ අවදානම හා අඩමානය තුරන්වීම
- නිවසර බල ශක්තිය ලැබීම
- ගොවිපළ තුළම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය වීම
- නිෂ්පාදන වියදම් අඩුවීම

- භූමි ඒකකයකින් ඒකක කාලයක දී සම්පත්වලින් උපරිම නිෂ්පාදනයක් ලබා ගැනීමට හැකිවීම

(ලකුණු 01 x 02 = 02)

iii) තෝරා ගන්නා ලද විවිධ වර්ධන විලාශ ඇති බෝග කිහිපයක් එකම ක්ෂේත්‍රයේ කන්නයෙන් කන්නයට නිශ්චිත චක්‍රීය පිළිවෙලකට වගා කිරීම ශෂ්‍ය මාරුව නොහොත් බෝග මාරුව ලෙස හඳුන්වයි.
(රූප සටහන් භාවිත කිරීම ලකුණු 02 විස්තර කිරීම ලකුණු 02) (ලකුණු 04)

7. i) ආහාර නිෂ්පාදනයේ දී/ ආහාර ගබඩා කිරීමේ දී/ සකස් කිරීමේ දී/ ආහාර අපනයනයේ දී ආදිය...

(ලකුණු 01 x 02 = 02)

ii) a) උදරයේ වේදනාව, බඩ පිපුම, පාචනය, වමනය, උණ, හිසරදය ආදිය... (ලකුණු 01 x 02 = 02)

b)

- ආහාරයක සිටිය හැකි ක්ෂුද්‍ර ජීවීන් තවත් ආහාරයක් හා ගැටීම වැළැක්වීම
- ආහාර පරිහරණය කරන්නන්ගේ පෞද්ගලික පවිත්‍රතාව ආරක්ෂා කර ගැනීම
- ආහාර වර්ග මිශ්‍රවන පරිදි එකට තැබීමෙන් වැළකීම
- ආහාර හොඳින් පිස ගැනීම
- නරක් වූ හා කල් ඉකුත් වූ ආහාර භාවිතයෙන් වැළකිම ආදිය... (ලකුණු 01 x 02 = 02)

iii) ශීතකරණය :- මෙහි දී ආහාරය $4C^0$ උෂ්ණත්වය යටතේ ගබඩා කරනු ලැබේ. ගෘහාශ්‍රිත ශීතකරණවල ආහාර පරිරක්ෂණය සිදුවන්නේ මෙම ක්‍රමය මගිනි.
උදාහරණ :- එළවළු, පලතුරු, කිරි ආදිය...

අධි ශීතකරණය :- මෙම ක්‍රමයේ දී අධි ශීතකරණය තුළ $-18C^0$ උෂ්ණත්වයක ආහාර ගබඩා කරනු ලැබේ. ඒ අනුව අධි ශීතකරණයේ දී ජලය මිදෙන උෂ්ණත්වයට වඩා අඩු උෂ්ණත්වයට ආහාර ගබඩා කිරීම මගින් ආහාර කල් තබා ගත හැක.
උදාහරණ :- මස්, මාළු
(කරුණු දෙක නිවැරදිව නම් කිරීම ලකුණු 01
විස්තර කිරීම ලකුණු 02
උදාහරණ දැක්වීම ලකුණු 01) (ලකුණු 04)